
# වැඩ බැරි දස ගැන කතා

.6

නිකොලායි නෝසව්



# ගුවනේ පාවෙන බැලුමක් සෑදීමට දක්සපාල කල්පනා කළ සැටි



රාදුගා ප්‍රකාශකායෝ · මොස්කව්



# වැඩ බැරි ළුස් ගැණ කතා

නිකොලායි නෝසව්

6

# ගුවනේ පාවෙන බැලුමක් සෑදීමට
# දක්ස පාල
# කල්පනා කළ සැටි

අනුවාදය – දැදිගම වි. රුද්රිගු

චිත්‍ර – බරිස් කලෞෂින්




දේදුන්න (රාදුගා) ප්‍රකාශකයෝ

මොස්කව්





දක්ස පාල පොත් කියවීමට බොහොම ආශා කරන නිසා එයා ඈත රටවල සංචාරයන් ගැන පොත් ගොඩක් කියවා තියෙනවා. හවස් කාලයේ වැඩක් නැතිව ඉන්න වේලාවලදී දක්ස පාල පොත් කියවා දැනගත් නොයෙක් කරුණු ගැන අනික් අයට විස්තර කරනවා. අනික් ළමයින් වැඩියෙන්ම අහන්න කැමති පිටරටවල් ගැන විස්තර. රට රටවල්වල සංචාරය කළ මිනිසුන් ලැබූ අත්දැකීම්, අපූරු සිදුවීම්, ආදි දේ ළමයින් බොහොම ආශාවෙන් අහනවා.

මේ වගේ කතා ඇසූ පසු කුසුම් පුරයේ කුරු ළමයින් රටවල් ගානේ සංචාරය කරන සැටි සිතින් මවා ගන්නවා. සමහරුන් සංචාරය කිරීමට සූදානම් වෙනවා. පා ගමනක් යාමට නැතිනම් ගඟේ ඔරු පැදීමට සමහරු යෝජනා කළා. එහෙත් දක්ස පාල මෙහෙම යෝජනා කළා:

''විශාල බැලුමකට හුළං පුරවලා අපි ගුවනේ පාවෙමින් සංචාරය කරමු.''


ඒ අදහසට හැම දෙනාම කැමති වුනා. කුසුම් පුරයේ කුරුමිට්ටෝ මීට පෙර කිසිම දාක බැලුමක නැගලා ගුවනේ පා වෙලා නැහැ. ගුවනින් යාම

ඉතාම හොඳ වැඩක් කියලා ළමයින් සියලු දෙනාම බොහොම සතුටු වුනා. එහෙත් ගුවනේ පාවෙන බැලුමක් හදන්නේ කොහොමද? මේ ගැන නම් එක ළමයකුවත් දැන සිටියේ නැහැ. මම ඒ ගැන කල්පනා කරලා ඔය ළමයින්ට විස්තර කරන්නම් කියලා දක්ස පාල කියුවා.

ඔන්න ඉතින් දක්ස පාල කල්පනා කරන්ට පටන් ගත්තා. දවස් තුනක් සහ රෑ තුනක් තිස්සේ ඔහු මේ ගැන කල්පනා කළා. බැලුම් බෝලය රබර් වලින් හදන්ට ඔහු තීරණය කළා. රබර් සාදන සැටි කුසුම් පුරයේ ළමයි දනිති. පීකුස් ගහට සමාන ගසක් කුසුම් පුරයේ තියෙනවා. ඒ ගසේ ලපටි අතු කැපුවාම රබර් කිරි වලට සමාන කිරි වගයක් ලබාගත හැකියි. මේ කිරි වර්ගය ටික වේලාවකින් උකු වෙලා රබර් බවට පත්වෙනවා. එයින් රබර් බෝල සහ සපත්තු කවර හදන්ට පුළුවනි.

විශාල බැලුමක් හැදීමට දක්ස පාල තීරණය කරලා රබර් කිරි සොයා ගෙන එන ලෙස දැන්වූවා. දක්ස පාල කිරි එකතු කරගන්ට ලොකු පීප්පයක් ලෑස්ති කළා. රබර් කිරි එකතු කරන්ට වැඩ බැරි දාසත් ගියා. අතර මගදී එයාට පාරේ කොල්ලන් සමග සෙල්ලම් කරමින් හිටිය ගුණෝව මුණ ගැසුනා.

''ගුණෝ අපි හදන්ට යන්නේ මොකක්ද කියලා දන්නවද? නුඹ දැනගත්තොත් ඉරිසියාවේ පුපුරන්ට පටන් ගනීවි,'' වැඩ බැරි දාස තම මිතුරාට පැවසුවා: ''නුඹ ඒ වගේ දෙයක් හීනෙන් පවා දැකලා නැහැ.''





''නුඹලා හදන්ට යන්නේ මොකක්ද?'' ගුණේ ඇසුවා.

''අපි ඉක්මනින්ම ලොකු බැලුම් බෝලයක් හදලා ගුවනේ පාවෙමින් රට, රටවල සංචාරය කරනවා.''

ගුණේට ඉරිසියාවක් ඇතිවිය. ඔහුටත් ගුවනේ පාවීමට ආශාවක් ඇතිවූ නමුදු ඔහු එය යටපත් කරගෙන උදම් අනන්ට විය:

''අපොයි, බැලුම් බෝලය මහ ලොකු කෙරුවාවක්! මම අර පුංචි කෙල්ලන් සමග යාළු වුනා.''

''මොන කෙල්ලන් සමගද?''





''අන්න අර ගොල්ලන් එක්ක'' යැයි කී ගුණේ කෙල්ලන් දෙදෙනකු පෙන්වමින් මෙසේ පැවසුවා: ''ආන්න අර කෙල්ලගේ නම මැස්සී, අනිත් කෙල්ලගෙ නම බොත්තමී.''

මැස්සී සහ බොත්තමී තරමක් ඈතින් සිටගෙන වැඩ බැරි දාස දෙස තරමක බියෙන් බැලුවා.

වැඩ බැරි දාස ඔවුන් දෙස යටැසින් බලා කතා කළා:

''එහෙමද! ගුණේ, නුඹ මගේ යාළුවෙක් නේද!''

''මම නුඹත් සමග යාළුයි. ඒ වගේම අර පුංචි කෙල්ලන් දෙදෙනා සමගත් යාළුයි. එකක් අනිකට බාධාවක් නොවෙයි.''

''නැහැ. එයට බාධාවක්. නුඹ පුංචි කෙල්ලන් සමග යාළු නම්, නුඹත් පුංචි එකෙක් තමයි. නුඹ දැන්ම පුංචි එවුන් එක්ක තරහ වෙයන්!''

''මම තරහ වෙන්නේ මොකටද?'' ගුණේ ඇසුවා.



''නුඹ දැන්ම උනුත් එක්ක තරහ වෙන්ට ඕන. නැතිනම් මම නුඹත් සමග තරහ වෙනවා.'' වැඩ බැරී දාස තර්ජනය කළා.

''ඉතින් තරහ වෙයන් මට මොකෝ?'' එසේ ඇසුවේ ගුණේය.

''ඔවු මම තරහ වෙනවා විතරක් නොවෙයි, නුඹේ මැස්සීටයි බොත්තමීටයි කනේ පහර දෙනවා!''

වැඩ බැරී දාස මිට මොළවා ගෙන ගෑණු ළමයි දෙදෙනාට පහර දීමට ගියා. ගුණේ වැඩ බැරී දාස යන මග අහුරා ඔහුගේ නළලට පහරක් ගැසුවා. මේ දෙදෙනා පොර කා ගන්ට පටන් ගත්තම ගෑණු ළමයින් දෙදෙනා බයවෙලා පැනලා දිව්වා.



''ආ, නුඹ ඒ ගෑනු කෙල්ලන් දෙදෙනා නිසා මගේ නළලට ගැහුවා නේද?'' ගුණේගේ නහයට පහර දීමට කුරුමාණම් අල්ලමින් වැඩ බැරී දාස කෑගහන්ට පටන් ගත්තා.

''නුඹ ඒ ළමයින්ව බය කරන්නේ මොකටද?'' එසේ අසන ගුණේ දැත් වැනුවා.

''අපොයි, ගෑණුන්ව ආරක්ෂා කරන ගෑණු කිච්චා!'' වැඩ බැරී දාස එහෙම කියලා ගුණේ ගේ ඔළුවට 'දඩෝස්' ගාලා පාරක් ගැහැව්වා. ඒ පාර බොහොම සැර නිසා ගුණේට ඉබේටම ඉන්දෙවුනා. එයාට නැගිට සිටීමට ශක්තිය ලැබුණු විගස එයා දුවන්නට පටන් ගත්තා.



''නුඹත් එක්ක මම හැබෑටම තරහයි!'' වැඩ බැරි ආස පැන දුවන ගුණෝට ඇහෙන්ට කෑ ගැසුවා.

''ඉතින් මට මොකද! නුඹ පළමුවෙන්ම ඒවි මා ළඟට යාළු වෙන්ට!'' ගුණෝ කියුවා.

''හොඳයි, බලාගෙන හිටපිය. මා නම් එන්නේම නැහැ. අපි බැලූමේ නැගිල ගුවනේ පා වෙනවා!''

''අඳුපායි, මොන ගුවනේද? ගහෙන් අත්තට වැටේවි, එච්චර තමයි.''

''නුඹලා කබලෙන් ලිපට වැටේවි!'' වැඩ බැරි ආස ගුණෝට විහිළු කළා. ඉන්පසු එයා ගියා රබර් කිරි එකතු කරන්ට.

පීප්පය පිරෙන තෙක් රබර් කිරි එකතු කළා. එවිට දක්ස පාල මූරිච්චියාට කියුවා කාර් වල රෝද වලට හුළං ගහන පෝම්පයක් ගෙනෙන්ටයි කියලා. ඔය පෝම්පයට දිග රබර් නලයක් සවිකරලා, එක් කොනකින් රබර් කිරි දැම්මා. දක්ස පාල මූරිච්චියාට කිවුවා සෙමින් හුළං ගහන්ටයි කියලා. එතකොට රබර් කිරි එක මහ විසාල බැලූමක් වගේ පිම්බෙන්ට පටන් ගත්තා. මුලදී හරියට සබන් පෙණ බුබුලක් වගෙයි. මේ බැලූම ලොකු වෙන්ට, වෙන්ට, දක්ස පාල ඒක වටේට රබර් කිරි ගෑවා. මූරිච්චියාත් සෙමින්, සෙමින් නොකඩවාම සුළං ගහපු නිසා එය විශාල බැලූම් බෝලයකට පරිවර්තනය වුනා.

බැලූම කොතරම් විශාලදැයි කීවොත්, එය වටේට රබර් කිරි ගෑමට පවා දුන් දක්ස පාලට බැහැ. අනික් කුරු ළමයින් බැලූම වටේට රබර් කිරි ගාන්ට ඕනැයි කියලා දක්ස පාල නියම කළා. සියලුම කුරු ළමයින් වැඩ කරන්ට පටන් ගත්තා. එක්, එක් ළමයෙක් එක්, එක් වැඩක් බැගින් කරන්ට වුනා. නමුත් වැඩ බැරි ආස විතරක් බැලූම් බෝලය වටේට යමින් සිවුරු හඬලන්ට පටන් ගත්තා. ඔහු එහෙම වටේට ගියේ බැලූම් බෝලය ළඟින් නොවෙයි,



එයට ඇතින්. වැඩ බැරි ආස බැලුම් බෝලය දිහා බලමින් තොල මතුළන්ට වුනා:

"බැලුම පුපුරාවි. දැන්, මේ දැන්ම පුපුරනවා! අපෝයි!"

එහෙත් බැලුම් බෝලය පිපිරුණේ නැහැ. ඒ විතරක් නොවෙයි විනාඩියක් පාසාම එය විශාල වුනා. දැන් ගෙවත්තේ තියෙන රට කොට්ටන් පඳුරේ අතු වලට නැගලා තමයි බැලුම වටේට රබර් කිරි ගාන්නට පුළුවන්.

ඔය විදිහට දවස් දෙකක් තිස්සේම බැලුම් බෝලයට හුළං ගසමින් එය වටේට රබර් කිරි ගෑවා. බැලුම් බෝලය ගෙයක් තරම් විශාල වුනාට පස්සේ හුළං ගැසීම නැවැත්තුවා. බැලුම් බෝලයට සවි කරලා තිබුණු රබර් නලය, ලනු පටකින් දක්ස පාල බැඳලා දැම්මේ, එය සුළඟේ පාවී යාම නවත්වා දැමීමටයි.

"දැන් ඉතින් රබර් කිරි හොඳට වේලෙන තුරු අපි වෙනත් වැඩ කරමු," දක්ස පාල අනික් කුරුමිට්ටන්ට කියුවා.

ඔහු බැලුම ගැට ගහලා තිබුණ ලනු පට රට කොට්ටන් ගහට බැඳලා දමලා, මිටි කොල්ලන්ව කට්ටි දෙකකට බෙදුවා. එක කට්ටියකට සේද පණුවන්ගෙන් සේද නූල් එකතු කරන්ට අණ කළා. අනික් කට්ටිය බිරියෝසා පොතු වලින් විශාල කූඩයක් හදන්ට ඕනැයි කියලා දක්ස පාල කියුවා.

දක්ස පාල මේ වැඩ එයාගේ මිතුරන් සමග කරන විට, කුසුම් පුරයේ චූට්ටෝ මේ විශාල බැලුම් බෝලය බලන්ට ආවා. හැම කෙනෙකුම ආශා කළා බැලුම් බෝලය අත ගාන්නට. සමහරු එය එසවීමට පවා ඉදිරිපත් වුනා.



''අපොයි, බැලුම් බෝලය බොහොම සැහැල්ලුයි. එක අතකින් වුනත් උස්සන්ට පුළුවන්,'' කුසුම් පුරයේ මිට්ටෝ එහෙම කියුවා.

''සැහැල්ලු බව නම් ඇත්ත තමයි. නුමුත් ඔය බැලුමට ගුවනේ පාවෙන්ට බැහැ.'' එහෙම කියුවේ තෝපික් නැමැති වාමන කොල්ලා.

''බැලුමට ගුවනේ පාවෙන්ට නොහැකි වෙන්නේ මොන හේතුවක් නිසාද?'' මිට්ටෝ ප්‍රශ්න කළා.

''එහෙම පාවෙන්නේ කොහොමද? එහෙම නම් දූනටමත් ඉහළට ඇදිලා තියෙන්ට ඕන නෙව. නමුත් බැලුම පොළවට වැටිලා තියෙනවා,'' තෝපික් කියුවා.

මිට්ටෝ කල්පනා කරන්ට පටන් ගත්තා.

''ඔව්, ඔව්. බැලුම සැහැල්ලු වුනාට ගුවනේ පාවෙන්ට තරම් සැහැල්ලු නැහැ. ඉතින් කොහොමද ඉගිලෙන්නේ?''

ඔවුන් එහෙම ප්‍රශ්න කළේ දක්ස පාලගෙන්. එවිට ඔහු මිට්ටන්ට මෙලෙස විස්තර කළා:

''පොඩ්ඩක් ඉවසාගෙන ඉඳපල්ලා. ඉක්මණින්ම නුඹලාට බලාගන්ට හැකි වේවි.''

දක්ස පාල මිට්ටන්ට එයට වඩා වැඩි විස්තරයක් නොකළ නිසා, ඒ ගොල්ල සැක කරන්ට පටන් ගත්තා. මේ අතරතුර කුසුම් පුරයේ හැම තැනම ගිහිල්ලා බොරු ආරංචි පතුරුව හරින්ට තෝපික් ඉදිරිපත් වුනා.

''ඔය බැලුම් බෝලය අහසේ පාවෙන්නේ කොහොමද?'' තෝපික් එහෙම ප්‍රශ්න කරලා ඔහුම පිළිතුරු දුන්නා: ''කුරුල්ලන් අහසේ පියාසර





කරන්නේ උන්ට අත්තටු තියෙන නිසා. ඔය රබර් බැලූමට ගුවනේ පාවෙන්ට ශක්තියක් නැහැ. ඔය තියන විදිහටම බිම වැතිරීලා තියේවි.''

ඉතින් අන්තිමේදී කුසුම් පුරයේ මිට්ටෝ සියලු දෙනාම තෝපික්ගේ කතාව හරී යැයි විශ්වාස කළා. සමහරු දක්ෂ පාලගේ ගෙයි වැට ළඟට ඇවිත් ඔහුට විහිළු කරනවා:

''ඔන්න බලාපිය, මෙන්න බලාපිය! බැලූම් බෝලය උඩු ගුවනේ පා වෙනවා! හා-හා-හා!''

එහෙත් දක්ස පාල මිට්ටන්ගේ විහිලු ගණන් ගත්තේ නැහැ. සේද දල හදලා ඉවර වුනාම, එය බැලූමට උඩින් දැම්මා.

ගෙවැට ළඟ හිටිය මිට්ටෝ දිගටම විහිලු කළා: ''අන්න බලාපල්ලා! බැලූම උඩින් දලක් දමලා. හරියට ඒක පාවෙන්ට යනවා ක්යලා වෙනට ඕන. හැබැ මිහිළුවක්. හා-හා-හා!''

ගහට බැඳල තියෙන බැලූම් බෝලය ඉහළ අත්තකට බඳින්ට කියලා දක්ස පාල අනික් අයට කියුවා.

එවිට කඩිනම් රාළ යි, මුරිච්චියයි ගහට නැගලා බැලූම බැඳපු ලනුව ඉහළට ඇද්දා. බැලූම බලන්ට ආපු වාමනයින් මේක දැකලා බොහොම සතුටු වුනා.

''හා-හා! මේක අපූරු බැලූමක්. ගුවනේ පාවෙන්නට නම් ලනුව ඉහළට අදින්ට ඕනද! ඉතින් එහෙම නම් පියාසර කරන්නේ කොහොමද?''

''ඉගිලෙන්නේ එහෙම තමයි. ඒ ගොල්ල බැලූම් බෝලය උඩ වාඩිවෙලා ලනුව ඉහළට අදිනවා. ඔන්න එතකොට බැලූම ගුවනේ පාවෙනවා.''

බැලූම් බෝලය ඉහළ අත්තට ගැට ගැහැව්වයින් පස්සේ සේද දලේ කොන්වලට බිරියෝසා පොතුවලින් හදාපු කූඩය සවිකරන්ට කියලා දක්ස පාල කියුවා. ඒ කූඩය හැඩය අනුව හරී හතරැස්. හතර වටේට වේවැල් බංකු හතරක් තියෙනවා. එක බංකුවක් උඩ මිටි කොල්ලන් හතර දෙනෙකුට වාඩි වෙන්ට පුළුවනි.





මේ විදිහට දැලේ කොන් හතරට වේවැල් කූඩය සවිකළාම, දක්ස පාල කියුවා ගුවනේ පාවෙන බැලූමේ වැඩ අවසානයි, කියලා. කඩිනම් රාළ ගුවනේ පාවෙන සැටි සිතින් මවා ගන්ට පටන් ගත්තා. දැන් ඉතින් බැලූමේ කූඩුවට නගින අය තමන්ගේ පැරචූට් හදා ගන්ට ඕනයි කියලා දක්ස පාල අනික් අයට දැනුම් දුන්නා.

''පැර-චූට් මොකටද?'' එහෙම ප්‍රශ්න කළේ වැඩ බැරි දාස.

''හිටිය හැටියේම බැලූම පිපිරුනොත්, අපට සිද්ද වෙනවා පැරචූට් වලින් බිමට බහින්ට,'' දක්ෂ පාල විස්තර කළා.

ඊළඟ දවසේදී දක්ස පාල සහ එයාගේ මිතුරෝ පැරචූට් හදන්ට පටන් ගත්තා. වාමන මිතුරන් ඔදුවාන්චික් මල් වලින් පැරචූට් හදන්ට පටන් ගත් අතර දක්ස පාල ඒවා සාදන සැටි සගයින්ට කියා දුන්නා.

විශාල බැලූම් බෝලය ගහක බැඳලා තියෙන සැටි දකින කුසුම් පුරයේ මිට්ටෝ මෙහෙම කියුවා:

''ඔය බැලූම පුපුරන තුරු ඔහොම බැඳලා තියේවි. ඔය බැලූමට ගුවනේ පා වෙන්ට බැහැ.''





''ඒයි, නුඹලා ගුවන් ගත වන්නේ නැද්ද? බැලුම පුපුරන්ට ඉස්සෙල්ලා පියාසර කරපල්ලා!'' වැට අයිනේ හිටිය මිට්ටෙක් කෑගැසුවා.

''ඔයා කලබල වෙන්ට එපා. හෙට උදේ අටට අපි ගුවන් ගත වෙනවා,'' එලෙස පිළිතුරු දුන්නේ දක්ස පාල.

බොහෝ දෙනෙක් හිනාවුනා. සමහරු මෙම පියාසැරිය ගැන සැක කළා.

''හිටි හැටියේම ඒ ගොල්ල බැලුමේ නැගලා ගුවන් ගත වුනොත්! හෙට උදේට ඇවිල්ලා බලන්ට ඕන,'' සමහර අය කියුවා.



**Н. Носов**

КАК ЗНАЙКА ПРИДУМАЛ ВОЗДУШНЫЙ ШАР

*на языке синхала*

© සිංහල අනුවාදය සහ චිත්‍ර,
රාදුගා ප්‍රකාශකයෝ, 1985







වැඩ බැරී දාසගේ හපන්කම් ගැන ඔබ වැඩි දුරටත් සැලකිලි
දක්වති නම්, කුසුම් පුරයේ වැසියන් ගැන
දැනගැනීමට ඔබ ආශා කරති නම් මේ පොත්
පෙළට අයත් අනික් පොත් කියවන්න:

**සංචාරය සඳහා සූදානම් වීම.**
**සංචාරය පටන් ගැනීම.**

Rs 40/-

ISBN 5-05-000313-X